**කොවිඩ් - 19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීමේ ව්‍යාපෘතිය සහ කොවිඩ් - 19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීමේ ව්‍යාපෘතිය සඳහා දෙවන අතිරේක මූල්‍යකරණය ව්‍යාපෘතිය - 2022**

---

කොවිඩ් - 19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීමේ ව්‍යාපෘතිය සහ කොවිඩ් - 19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීමේ ව්‍යාපෘතිය සඳහා දෙවන අතිරේක මූල්‍යකරණය ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන, 2020 අප්‍රේල් 02 දිනැති අංක පීඒඩී 3852 දරන ලෝක බැංකු වාර්තාවේ 52 වගන්තිය සහ 2021 අප්‍රේල් 22 දිනැති අංක පීඒඩී 4442 දරන ලෝක බැංකු වාර්තාවේ 71 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය**

ව්‍යාපෘතියේ ණය ගිවිසුම්වලට අනුව, සෞඛ්‍ය අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (ව්‍යා.ක.ඒ) මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. කොවිඩ් - 19 හේතුවෙන් ඇති වූ තර්ජන වැළැක්වීම, හඳුනාගැනීම සහ ඒ සඳහා ප්‍රතිචාර දැක්වීම සහ ශ්‍රී ලංකාවේ මහජන සෞඛ්‍යය සූදානම සඳහා ජාතික පද්ධතින් ශක්තිමත් කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම් අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත මුළු පිරිවැය රු. මිලියන 41,717.45 කට සමාන එ.ජ.ඩො. මිලියන 209.11 ක් වූ අතර ඉන් රු. මිලියන 12,271.25 කට සමාන එ.ජ.ඩො. මිලියන 61.51 ක් මූල්‍යනය කිරීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟ වී තිබුණු අතර, රු. මිලියන 29,446.20 කට සමාන එ.ජ.ඩො. මිලියන 147.60 ක මුදලක් ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව විසින් මූල්‍යනය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු 2020 අප්‍රේල් 04 දින ආරම්භ කර තිබුණු අතර 2023 දෙසැම්බර් 31 දින වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි.

**1.3 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.1 ඡේදයේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනට ඒකාබද්ධ මූල්‍ය තත්ත්වය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි ඒකාබද්ධ මුදල් ප්‍රවාහය, ඒකාබද්ධ ලැබීම් සහ ගෙවීම් සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

**1.6 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවයමෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුනු පිලිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2. ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.1 ගිණුම්කරණ අඩුපාඩු**

| ගිණුම්කරණ අඩුපාඩුව / විගණන නිරීක්ෂණය | මුදල රු. මිලියන | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| 2020 සහ 2021 වර්ෂවල කොවිඩ් 19 රෝගය පැතිරීම පාලනය කිරීම සඳහා ගොඩනැගිලි ඉදිකිරීම සහ උපකරණ මිලදී ගැනීම ව්‍යාපෘතිය වෙනුවෙන් ශ්‍රී ලංකා යුද හමුදාව සිදුකර ඇතත්, මෙම ඉදිකිරීම්වලට අදාළ ස්ථාවර වත්කම් ලේඛන හෝ මිලදී ගැනීම්වලට අදාළ භෞතික සත්‍යාපන වාර්තා විගණනය සඳහා ඉදිරිපත් නොවීය. | 859 | ශ්‍රී ලංකා යුද හමුදාව ලිඛිතව දන්වා සිටියේ මෙම උපකරණ සහ ඉදිකිරීම් ද්‍රව්‍ය ශ්‍රී ලංකා යුද හමුදාව සතු වත්කමක් ලෙස ගණන් බලා ඇති බවයි. | සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතු ය. |

## 2.2 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| අංකය | නීතිරීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම / විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 139(4) | සෑම ගෙවීමක් සඳහාම විධිමත් රිසිට්පතක් ලබා ගැනීම පිළිබඳ ගෙවන නිලධාරියා වගකිව යුතු ය. කෙසේ වෙතත්, කොවිඩ් කාලසීමාව තුළ සෞඛ්‍ය සේවකයින් ප්‍රවාහනය සඳහා භාවිත කළ බස් රථ සඳහා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට ගෙවා ඇති රු. මිලියන 45කට අදාළව විධිමත් රිසිට්පත් ලබාගෙන නොමැති බව නියැදි විගණන පරීක්ෂණයේදී අනාවරණය විය. | අදාළ ඩිපෝවෙන් බලයලත් නිලධාරියාගේ අත්සන් සහිත ලිපිය ලබාගෙන ඇත. | මුදල් රෙගුලාසි අනුගමනය කළ යුතු ය. |
| (ආ) | මුදල් රෙගුලාසි 262(2) | සියලුම ගෙවන ලද වවුචර් සහ උපකාරක ලියකියවිලි "ගෙවන ලදි" ලෙස මුද්‍රා තැබිය යුතු අතර මුදල් පොතේ සටහන් කර ඇති ගෙවූ දිනය මුද්‍රා තැබිය යුතුය. කෙසේ වෙතත් ව්‍යාපෘතිය මගින් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද වවුචර්වල ඉහත වගන්තියට අනුව මුද්‍රා තබා නොතිබූ බව නියැදි විගණනයේදී නිරීක්ෂණය විය. | එකඟ වෙමි. අංක 262 (2) දරන මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි අනුගමනය කළ යුතු ය. |
| (ඇ) | මුදල් රෙගුලාසි අංක 267(1) | සේවකයකුගේ වැටුප හෝ වේතනය ආදායකයාටම ගෙවා ඇති බවට ඔහුගේ අත්සන අදාළ වැටුප් ලේඛනයේ හෝ වැටුප් පත්‍රිකාවේ සටහන් කළ යුතුය, කෙසේ නමුත් සමාලෝචිත වර්ෂයේ දී නිලධාරීන්ට ගෙවන ලද රු. මිලියන 15 ක්වූ වැටුප් සම්බන්ධයෙන් මෙම විධිවිධාන අනුගමනය කර නොතිබුණි. | වෙනම වැටුප් ලැයිස්තුවක් පවත්වාගෙන ගිය අතර එය විගණනයට ඉදිරිපත් කළ හැකිය. | මුදල් රෙගුලාසි අනුගමනය කළ යුතු ය. |
| (ඈ) | මුදල් රෙගුලාසි 371(2)(ආ) | තත්කාර්ය අතුරු අග්‍රිමය අදාළ කාර්යය අවසන් වූ වහාම පියවිය යුතුය, කෙසේ නමුත්, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වටිනාකම රු. මිලියන 2 ක් වූ අවස්ථා 20කදී ලබාදී තිබූ අත්තිකාරම් නිරවුල් කිරීම සිදු කර නොතිබුණි. | Covid 19 වසංගතය පැතිරීම හේතුවෙන් සංචරණ සීමා කර තිබීම සහ රටේ හදිසි තත්ත්වයක් පැවැති අවස්ථාවේ මෙම අත්තිකාරම් දීම සිදු කර ඇති බව කරුණාවෙන් සලකන්න. | මුදල් රෙගුලාසි අනුගමනය කළ යුතු ය. |
| (ඉ) | මුදල් රෙගුලාසි අංක 396 | රුපියල් 45,000 ක් වූ කල් ඉකුත් චෙක්පත් 02 ක් සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. | එකඟ වෙමි. අංක 396 දරන මුදල් රෙගුලාසි අනුව ක්‍රියාමාර්ග ගනු ලැබේ. | මුදල් රෙගුලාසි අනුගමනය කළ යුතු ය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඊ) | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් අංක GIR/2019/39/ CINSA (II) සහ 2019 ජූලි 09 දිනැති චක්‍රලේඛයේ 02 ඡේදය | වැට් බද්ද ගෙවීමට පෙර අදාළ සැපයුම්කරු වැට් බදු සඳහා ලියාපදිංචි පුද්ගලයකුද යන්න සහ ඔහුගේ වැට් බදු ලියාපදිංචි අංකය සක්‍රියද යන්න තහවුරු කිරීමට කටයුතු කළ යුතු වුවත්, එයට අනුකූල නොවී අවස්ථා 9 කදී රු.මිලියන 175 ක් සැපයුම්කරුවන් වෙත ගෙවා තිබුණි. | පියුචර් ඔටෝ මොබයිල් පුද්ගලික සමාගම, සුරේන් කෝක් එජන්සීස් පුද්ගලික සමාගම, සහ අබාන්ස් සමාගම යන සැපයුම්කරුවන්ගේ ලියාපදිංචි අංකය අපි තහවුරු කර ඇත්තෙමු. වැට් බදු ලියාපදිංචිය තහවුරු කිරීමේ ලිපි අමුණා ඇත. ඉන්වොයිස් කාලය තුළ අනෙකුත් ආයතනවල සක්‍රියභාවය සත්‍යාපනය කෙරේ. | අදාළ චක්‍රලේඛ අනුගමනය කළ යුතු ය. |
| (උ) | 2019 මාර්තු 05 දිනැති කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2019 හි 9.3 වගන්තිය | ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව අවම වශයෙන් මාස දෙකකට වරක් රැස්විය යුතුය; කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂය තුළ කමිටුව රැස්වී නොමැති බව විගණනයට අනාවරණය විය. | නිරීක්ෂණයට එකඟ වෙමි. ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව 2022.10.19 දින පත් කරන ලද අතර එය 2022 නොවැම්බර් මස පැවැත්වීමට නියමිත වුවත් පැවැත්විය නොහැකි විය. | අදාළ චක්‍රලේඛ අනුගමනය කළ යුතු ය. |
| (ඌ) | සෞඛ්‍ය අමාත්‍යාංශය සහ එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF) සමඟ 2020 මැයි 20 දින අත්සන් කරන ලද මුල් ගිවිසුම සහ 2021 මැයි 31 දින අත්සන් කරන ලද සංශෝධනය | ව්‍යාපෘතිය විසින් ඩොලර් මිලියන 35.24 ක උපරිම සීමාවක් තුළ වෛද්‍ය උපකරණ ලබා දීමට එකඟ වී ඇත. ඒ අනුව, 2020 වසරේ අවස්ථා තුනකදී ඩොලර් මිලියන 30 ට සමාන රු.මිලියන 5,550 ක් සහ 2021 වර්ෂයේ දී ඩොලර් මිලියන 2.66 කට සමාන රු. මිලියන 533 ක් එකතුව ඩොලර් මිලියන 32.64 කට සමාන රු. මිලියන 6,083 අත්තිකාරම් ලෙස ගෙවා තිබුණි. 2021 දෙසැම්බර් 16 වැනි දින එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල විසින් ඉදිරිපත් කරන ලද අවසාන ගිණුම් වාර්තාවට අනුව, Covid-19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීමේ ව්‍යාපෘතිය වෛද්‍ය උපකරණ ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල වෙත ඩොලර් මිලියන 32.64ක් ගෙවා තිබුණු අතර රු. මිලියන 740 ට සමාන ඩොලර් මිලියන 2.03 ක ඉතිරි මුදල ලබා ගැනීමට නොහැකි වී තිබුණි. ඉහත අත්තිකාරම් මුදල වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | UNICEF වෙතින් USD 2,038,315.68 ආපසු ලබා ගැනීමට අවශ්‍ය සියලු පියවර අපි දැනටමත් ගෙන ඇත. ලෝක බැංකුවේ සේවාදායක සම්බන්ධතා පද්ධතිය හරහා පියවීම් කිරීමට පහසුකම් සලසමින් ලෝක බැංකුව සමඟ සාකච්ඡා කර ආපසු ගෙවීම සඳහා වන අයදුම්පත දැනටමත් යුනිසෙෆ් වෙත ඉදිරිපත් කර ඇත.<br>ආපසු ගෙවීමට අදාළ ඉතිරි ක්‍රියාකාරකම් ලෝක බැංකුවේ සහ එක්සත් ජාතීන්ගේ ළමා අරමුදලෙහි කොටසක් වන අතර ඔවුන් හැකි ඉක්මනින් කාර්යය සම්පූර්ණ කරනු ඇතැයි විශ්වාස කරමි. | ගිවිසුමට අනුකූල විය යුතු ය. |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 මතභේදාත්මක ගනුදෙනු**

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | Covid-19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීමේ ව්‍යාපෘතිය නියමිත දිනට සේවක භාර අරමුදල් ගෙවීම් සඳහා ලියාපදිංචි නොවීම හේතුවෙන් රු. 44,000 ක් සේවක භාරකාර අරමුදලට අධිභාර ලෙස ගෙවීමට සිදුව තිබුණි. මෙය නිෂ්ක්‍රීය වියදමක් බව විගණනයේදී නිරීක්ෂණය කෙරේ. | එකඟ වෙමි. වසංගත කාලය තුළ Covid - 19 හදිසි අවස්ථා තත්ත්වය යටතේ Covid-19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීමේ ව්‍යාපෘතිය ලෙස 2020.05.06 වන දින ස්ථාපිත කර ඇත. | එම පාඩුව වගකිවයුතු පුද්ගලයන්ගෙන් අයකරගත යුතු යි. |
| (ආ) | ව්‍යාපෘතියේ අරමුදල් යොදා ගනිමින් 2022 වර්ෂයේදී රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් මිලදී ගන්නා ලද ඖෂධ සඳහා නාමමාත්‍රා ඉන්වොයිසි මත පදනම්ව රු. මිලියන7,660 ක් ගෙවා තිබුණි. කෙසේ වෙතත් ඖෂධ බෙදාහැරීමේ නියෝගවලට අනුව ඇතැම් ඖෂධ 2023 වර්ෂයේදී ලැබී ඇති බවත් ඒ අනුව වාණිජ ඉන්වොයිසි සහ තොග ලැබීම් පත් ලබාදී ඇත්තේ ගෙවීම් කිරීමෙන් පසුව බවත් නිරීක්ෂණය කෙරේ. | එම ප්‍රසම්පාදන යාන්ත්‍රණය රටේ හදිසි තත්ත්වය යටතේ ප්‍රසම්පාදනයේදී ලබා දී ඇති ප්‍රතිපාදන මත පදනම් වන බව ද කරුණාවෙන් සලකන්න. රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් කරන ලද පැහැදිලි කිරීම මේ සමඟ අමුණා ඇත. | මුල් ලියකියවිලි මත පදනම්ව ගෙවීම් සිදු කළ යුතු ය. |